කිතුල්ගල ප්‍රදේශයේ ජල ක්‍රීඩාවේ යෙදී සිටි සංචාරකයන්/සංචාරකයෙකු බේරා ගත් සංචාරක උපදේශන පහසුකම් සපයන්නෙකු ජලයට වැටීමෙන් මිය ගිය පුවත, පුවත් වාර්තාවන් දෙකක් ඔස්සේ ඉදිරිපත් වී තිබුණේ මේ අයුරිනි.
මව්බිම - "සංචාරකයන්ගේ දිවි බේරාදුන් මගපෙන්වන්නා ඇල්ලට බිලි වෙයි"
අරුණ - "සුද්දියකට ජීවිතය ලබා දී ජල රකුසාට බිලි වූ නපුරාගල 'මධු'"
ඔබ සිතනා ලෙසට,
1) විදේශිකයින්ව සමේ වර්ණය ඔස්සේ කොන් කිරීමට ලක් කරනා "සුද්දි" වැනි යෙදුම්, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය රටේ ප්‍රධාන තැනක් ගන්නා ශ්‍රී ලංකාව වැනි රටක මාධ්‍ය තුළ මෙසේ දිගින් දිගටම භාවිතා කිරීම කෙතරම් යෝග්‍ය ද?
2) ඒ අනුව, වඩාත් යෝග්‍ය සිරස්තලය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන පුවතේ සිරස්තලය ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

